රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2014

මගේ අංක: EST /5/1/3
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.05.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>උසස්වීමක දී වැටුප් පරිවර්තනය කිරීම</u>**

රජයේ නිලධරයෙකු යම් තනතුරකට හෝ තනතුරක පන්තියකින් පන්තියකට උසස් කිරීමේ දී ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තියේ විධිවිධාන අනුව වැටුප් පරිවර්තනය කරනු ලැබේ. එසේ වැටුප් පරිවර්තනය කිරීමේ දී පූර්ව තනතුරේ/ පන්තියේ/ ශ්‍රේණියේ වැටුප් වර්ධක දිනයට වෙනස් දිනක දී උසස් වූ නිලධරයන්ට සාපේක්ෂව එම නිලධරයාට පසුව පූර්ව තනතුරේ/ පන්තියේ/ ශ්‍රේණියේ වැටුප් වර්ධකය ද උපයාගෙන වැටුප් වර්ධක දිනයේ ම උසස් වූ නිලධරයන් වැඩි වැටුප් පියවරක් ලැබීම නිසා ඇති වී ඇති වැටුප් විෂමතා ඉවත් කිරීමට 2013.10.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය විය.

02. ඒ අනුව, ඉහත 01 ඡේදයේ සඳහන් පරිදි විෂමතාවට ලක් වූ නිලධරයන් සම්බන්ධයෙන් පහත තොරතුරු ද සමඟ වැටුප් විෂමතාව ඉවත් කිරීමට අවශ්‍ය අනුමතිය ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

i. නිලධරයා උසස් වීමට පෙර දැරූ තනතුර සහ එහි පන්තිය/ ශ්‍රේණිය
ii. උසස් වීමට පෙර හිමිව තිබූ වැටුප් පරිමාණය සහ ලැබූ වැටුප් පියවර
iii. උසස් වීමට පෙර වැටුප් වර්ධක දිනය
iv. උසස් වූ දිනය
v. උසස් වූ තනතුර සහ එහි පන්තිය/ ශ්‍රේණිය
vi. උසස් වීමට අදාල වැටුප් පරිවර්තනය
vii. නිලධරයාට වැටුප් විෂමතාවක් ඇති බවට සනාථ කිරීමට සංසන්දනය කරනු ලබන නිලධරයා සම්බන්ධයෙන් ද ඉහත i සිට vi දක්වා තොරතුරු

03. මෙවැනි වැටුප් විෂමතා ඉවත් කිරීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමේ දී, උසස්වීම සිදු කරන දිනය දක්වා අදාල නිලධරයන් සම්බන්ධව සිදු කර ඇති සියලුම වැටුප් පරිවර්තන නිවැරදි බවට නිසි බලධරයෙකුගේ සහතිකයක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

පී.බී. අබේකෝන්<br>
ලේකම්<br>
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය